ජූලි 19 දින රාවය පුවත්පතේ ප්‍රධාන සිරස්තල ප්‍රවෘත්තිය වෙත සමාජ මාධ්‍යයන් තුලද විශේෂ අවධානයක් යොමු වී තිබුණු අතර, Ethics Eye හි අවධානයටද එය යොමු කොට තිබිණි.

"කොවිඩ් සැක අය හමුදාවෙන් උස්සයි" යන සිරස්තලය යටතේ ඉදිරිපත්ව ඇති මෙම ප්‍රවෘත්තියේ පළමු පරිච්ඡේදයේ, "යුද හමුදාව රාත්‍රී කාලයේදී ස්වයං නිරෝධායනයට ලක්වූවන් සිටින නිවෙස්වලට කඩා පැන පවුල් පිටින් ත්‍රස්තවාදීන් සේ කුදලාගෙන යන බව රාවයට වාර්තා වේ" යනුවෙන් දැක්වේ.

මෙහි තෙවැනි පරිච්ඡේදය ඔස්සේ නිසි මූලාශ්‍රයක් ඉදිරිපත් කරමින් දැක්වෙන්නේ, "...නිරෝධායනයට ලක්කර සිටින පුද්ගලයින් මෙසේ පැහැරගෙන ගොස් ඇති බවයි". කෙසේ වෙතත් එතැනින් එහාට ප්‍රවෘත්තිය පුරාම මෙම "පැහැර ගෙන" යෑම "රැගෙන යෑමක්" බවට පත්ව තිබෙනු ද නිරීක්ෂණය කළ හැකි විණි.

මෙසේ ගත් විට පාඨකයින් ලෙසින් අපට ඇසීමට ප්‍රශ්න කිහිපයක් තිබේ. නිරෝධායනයට ලක්කර සිටින්නන් "ත්‍රස්තවාදීන් සේ කුදලාගෙන යන බව" විශ්වාසනීය මූලාශ්‍ර ඔස්සේ ලබාගත් වාර්තාවක්ද? එම තොරතුර ද ලබාගෙන ඇත්තේ තෙවැනි පරිච්ඡේදයේ මූලාශ්‍රය ඔස්සේමද? එසේ නම් එය පැහැදිලිව සඳහන් කළ යුතු නොවේද? පුවත් වාර්තාවේ තෙවැනි පරිච්ඡේදයෙන් එපිටට සඳහන් වන්නේ පුද්ගලයින්ව "රැගෙන යෑමක්" නම්, එය මුල් පරිච්ඡේදයේ "පැහැර ගැනීමක්/කුදලාගෙන යෑමක්" ලෙසින් දැක්වී ඇත්තේ මන්ද? සිදුව ඇත්තේ පැහැරගෙන යෑමක්ද නැතිනම් රැගෙන යෑමක්ද යන්න පැහැදිලි නොවේ නම්, මෙම පුවත් වාර්තාවට යොදා ඇති සිරස්තලය පාඨකයා නොමඟ යවන සුළු නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #Ravaya